# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 2171635 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1169 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 16/07/2024 පැය 0540

## මාධ්‍ය නිවේදනය

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය.**

2024.07.15 වන දින සවස් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ සිරිපාල පින්තු මාවතේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීම් 02 ක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 520 ක් සහ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 400 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22 හා 31 වයස්වල පසුවන මීදිගම හා වැල්ලම්පිටිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.07.15 වන දින සවස් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ස්වර්ණ චෛත්‍ය පාර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 08 මිලිග්‍රෑම් 840 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය.**

2024.07.15 වන දින රාත්‍රී කාලයේ අතුරුගිරිය පොලිස් වසමේ කපුරුගොඩ පාර ප්‍රදේශයේදී අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 600 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන පනාගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. නීති විරෝධී මත්පැන් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - මීගමුව පොලිස් ස්ථානය.

2024.07.15 වන දින අළුයම් කාලයේ මීගමුව පොලිස් වසමේ දළුපත සිරකඳවුර අසලදී මීගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 57.75 ක් සමග සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන කටාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. සැකකටයුතු මරණයක් - අයගම පොලිස් වසම.

2024.07.15 වන දින උදෑසන කාලයේ අයගම පොලිස් වසමේ ඇරැපෝරුව ප්‍රදේශයේ හිසේ තුවාල සහිතව අයගම රෝහලට ඇතුලත් කරන ලද පුද්ගලයෙකු මියගොස් ඇති බවට අයගම පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 50 ක් වන ඇරැපෝරුව, උස්වත්ත, අයගම ලිපිනයේ පදිංචිකරුවෙකි.**

මරණකරු නිවසේ තනිවම සිට ඇති අතර බිරිඳ ඇගේ මවගේ නිවසට ගොස් සිට ඇති අතර, පුතා පන්සට ගොස් සිට අවස්ථාවේදී මෙම සිදුවීම සිදුව ඇති බවට පොලිසිය කළ විමර්ශනයේදී අනාවරණය වී ඇත. මහේස්ත්‍රාත් පරීක්ෂණය සහ පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මෘත ශරීරය අයගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අයගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. නාඳුනන මළ සිරුරක් - කොටුව පොලිස් වසම.

2024.07.14 වන දින රාත්‍රී කාලයේ කොටුව දුම්රිය ස්ථානය ඉදිරිපිට මාර්ගය අයිනේ රැඳී සිටි පුද්ගලයෙකු මියගොස් ඇති බවට කොටුව පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත. මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.

**මරණකරු වයස අවුරුදු 60 ත් 65 ක් පමණ වන උස අඩි 05 අඟල් 04 ක් වන තළෙළු, කෙට්ටු සිරුරකින් යුත් පිරිමි පුද්ගලයෙකි. අවසන් වරට අත් කොට කමිසයක් සහ රතු පැහැති සරමක් හැඳ සිටී.**

මෘත ශරීරය හදිසි මරණ පරීක්ෂණය සිදුකර කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කොටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - වාරියපොල පොලිස් වසම.

2024.07.15 වන දින රාත්‍රී කාලයේ වාරියපොල පොලිස් වසමේ සුමංගල ගිනිමාන්න අතුරු මාර්ගයේ නාවින්න විදුහල අසලදී සුමංගල දෙස සිට ගිනිමාන්න දෙසට ධාවනය වූ යතුරු පැදියක් මාර්ගය අයිනේ ගමන් කරමින් සිටි පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ කාන්තාව, යතුරු පැදිකරු සහ පසුපැදිකරු වාරියපොල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පැදිකරු සහ කාන්තාව වැඩිදුර ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී පදික කාන්තාව මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 66 ක් වූ වහන්තරේ, වාරියපොල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වාරියපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**